# දෙවනගල රජමහා විහාරය ආශ්‍රිත පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

ආර්.එම්.එන්.එස්. රත්නායක[17]

සබරගමු පලාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ සතර කෝරළයට අයත් දෙවනගල නම් ග්‍රාමයෙහි පිහිටි දෙවනගල රජමහා විහාරය පුරාවිද්‍යාත්මක, ඓතිහාසික සහ කලාත්මක යනාදි අංශයන්ගෙන් වැදගත් වන විහාරස්ථානයකි. දර්ශනීය වටපිටාවක්ට මැදි වු ගල්තලාවක් මැද මෙම විහාරය පිහිටා ඇති අතර උතුවන්කන්ද, අම්බලකන්ද, දනගිරිගල, බතලේගල, කිරිගල, කඩුගන්නාව, අම්බුලුවාව, වාකිරිගල යන කඳු පංතින්වලින් වට වී තිබේ. මෙම විහාරස්ථාන භූමිය තුළ දී ඉපැරණි ටැම්පිට විහාර මන්දිරයක්, චෛත්‍යයක්, බෝධි වෘක්ෂයක්, දැඩිමුණ්ඩ දේවාලයක්, පැරණි ගල් විහාරයක් හා අලංකාර වු පොකුණක් හා සෙල්ලිපි කිහිපයක් දක්නට ලැබේ. සාහිත්‍ය මූලාශ්‍රයන්ට අනුව එහි ඉතිහාසය අනුරාධපුර සමය දක්වා දිව යන අතර මෙහි පළමු විහාරය ධාතුසේන රජු විසින් කර වු බව මහාවංසයේ සඳහන් වී තිබේ. මීට අමතර ව මෙම ස්ථානයේ තිබී හමු වන ශිලාලේඛන ද ඉතා වැදගත් වේ. පොලොන්නරු සමයේ වාසය කළ මහා පරාක්‍රමබාහු රජු විසින් මෙහෙයවන ලද බුරුම සටනේ දී ලත් ජයග්‍රහණයට කෘතගුණ සැලකීමක් වශයෙන් **නගරගිරි කිත්ති** නම් සෙන්පතියාට කල ගම්වර ප්‍රදානයක් පිළිබඳ මෙම ගිරි ලිපියේ සඳහන් වේ. මීට අමතරව පළමු වැනි විමලධර්මසූරිය රජු විසින් දෙවනගල රතනාලංකාර තෙරුන්ට කළ ගම්වර ප්‍රදානයක් පිළිබඳ සඳහන් තවත් ලිපියක් හමු වී තිබේ. පළමු වැනි විමලධර්මසූරිය රජු විසින් කරවා ඇති මෙම ස්ථුපය චතුරස්‍රාකාර ශිලාමය වේදිකාවක් මත ඉදි කර ඇති අතර බුබ්බුලාකාර හැඩයෙන් යුක්ත වේ. මෙහි ඇති ටැම්පිට වෙහෙර තුල මහනුවර සම්ප්‍රදායට අයත් ඉපැරණි සිතුවම් චිත්‍රණය කර ඇති අතර සූවිසි විවරණය, සොලොස්මස්ථාන, අරහත් රූප, දෙව්ලෝ දර්ශන ආදි චිත්‍ර දක්නට ලැබේ. දැවයෙන් කරන ලද උළුවස්සක් දකින්නට ලැබෙන අතර එය ද විශිෂ්ට නිර්මාණයකි. දළදා වහනසේ තැන්පත් කිරිමට සෑදූ සෙල්මුවා ආසනයක් ද දක්නට ලැබේ. වර්තමානයේ පැරණි බුදුමැදුර ලෙස සැලකෙන ස්ථානය අතීතයේ පරාක්‍රමබාහු රජු නවාතැන් ගත් ස්ථානය වශයෙන් සැලකේ. මෙහි ඇති ඉපැරණි ගල් ගේ පැරණි වාස්තුවිද්‍යාව හා විස්මිත තාක්ෂණය පිළිබඳ ඇති කදිම උදාහරණයකි. මෙම වාස්තුවිද්‍යා නිර්මාණ පිළිබඳ මෙමගින් අධ්‍යයනය කරනු ලැබේ.

ප්‍රමුඛ පදඃ දෙවනගල විහාරය, කලාත්මක වැදගත්කම

[17]මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.